# ඉංගිරිසින් තමන්ට වූ අභියෝගය හඳුනාගැනීම

මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කිරීමට පෙර මෙරට අධ්‍යාපනය විවිධ පුද්ගලයන් අත තිබුණු නමුදු උන්වහන්සේගේ වැඩමකිරීමෙන් පසුව අධ්‍යාපනය භික්ෂූන් වහන්සේ අතට පත්වී ඇති බව පැහැදිලි ය. මෙරට අධ්‍යාපනය කිසි දිනෙක බමුණන්ගේ ආධිපත්‍යයට යටනොවූ බව පෙන්වීම පසුගිය ලිපියේ අරමුණ විය. මිහිඳු හිමියන්ගෙන් පසුව භික්ෂූන් වහන්සේ අත අධ්‍යාපනය තිබූ බැවින් හා උන්වහන්සේ එකල මෙරට විද්වතුන් වහන්සේ වීම හේතුවෙන් ජනතාව කියවිය යුතු පොතපත පිළිබඳ ව විශාල බලපෑමක් කිරීමට උන්වහන්සේට හැකිවිය. එබැවින් මහාවිහාරයට එකල මෙරට ථෙරවාදය රැක ගැනීමෙහි ලා බාධක නොමැති විය.

එහෙත් අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙරට භික්ෂූන් වහන්සේ දැරූ තැන ඉංගිරිසින් පැමිණීමෙන් පසුව ක්‍රමයෙන් නැතිවීම ඇරඹිණි. ලන්දේසි සමයේ දී ද මෙරට ලන්දේසි පල්ලිය යටතේ පාසල් ආරම්භ වූ නමුත් ඔවුන්ට අධ්‍යාපනය තමන් යටතට ගැනීමට නොහැකි විය. පල්ලිය යන්නෙහි මුල් තේරුම අධ්‍යාපනය ලබා දෙන තැන යැයි කියැවෙයි. ලන්දේසීන් තම පාසල්වලට ඇතුළත්කිරීමේ දී ආගම හා නම වෙනස්කිරීම ද  කොන්දේසි ලෙස ඉදිරිපත්කළ නමුත් සිංහල බෞද්ධයෝ ඉන් ගැලවෙන ක්‍රම දැන සිටියහ.

පාසලේ දී ලන්දේසීන්ගේ රෙපරමාදු ක්‍රිස්තියානීන් වූ සිංහලයෝ ගෙදරදී නැවතත් බෞද්ධයෝ වූහ. පාසලේ දී ලන්දේසීන් දුන් නමක් භාවිතා කළ ඔවුහු ගෙදර දී තමන්ට දෙමව්පියන් තැබූ නම් පාවිච්චි කළහ. දැනට අවුරුදු හැත්තෑවකට පමණ පෙර ද ගම්වල සිංහලයන්ට පාසලට නම හා ගෙදරට නම යනුවෙන් නම් දෙකක් විය. පාසලේදී රෙපරමාදු ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ලද සිංහලයෝ ගෙදර දී (ගමේ දී) භික්ෂූන් වහන්සේගෙන් බෞද්ධ අධ්‍යාපනයක් ලැබූහ. මේ හේතුවෙන් අධ්‍යාපනයෙහි ලා භික්ෂූන් වහන්සේට හිමි තැන නැතිකිරීමට ලන්දේසීන්ට නොහැකි විය.

ලන්දේසීහු පෘතුගීසීන්ට වඩා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි වර්ධනය වූ පිරිසක් වූහ. පෘතුගීසීන් ක්‍රිස්තියානි නූතනත්වය ඇරඹි කාලයෙහි ම මෙන් පෙරදිගට හා අපරදිගට බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය රැගෙන ගිය බැවින් ඔවුහු පසු කලෙක පැමිණි ලන්දේසීන් තරමට නූතනත්වයට ගොදුරු වී නො සිටිය හ. එහි ප්‍රතිඵලය වූයේ පෘතුගීසීන් අප රටට හා වෙනත් පෙරදිග රටවලට පැමිණෙන විටත් යම් ප්‍රමාණයකට කතෝලික චින්තනයෙහි ගිලී සිටීම ය. (ඔවුන් ආගමින් එදත් අදත් කතෝලිකවීම සමග මෙය පටලවා නොගත යුතු ය.) අප ඉහතින් සඳහන් කර ඇති ආකාරයට කතෝලික චින්තනයෙහි සාමුහිකත්වය යන හැඟීම ආදී පෙරදිග චින්තනවලට සමීප දෑ වෙයි. එබැවින් පෘතුගීසීන් ද සතුව එකල පැවති සාමුහිකත්වය ආදී අදහස් හේතුකොටගෙන ඔවුන්ගේ සංස්කෘතිය ලන්දේසි සංස්කෘතියට වඩා පෙරදිග සංස්කෘතීන්ට සමීප විය,

පෘතුගීසි සංස්කෘතිය හා චින්තනය සමග ලන්දේසි සංස්කෘතිය හා චින්තනය සංසන්දනය කිරීමේ දී පෙනී යන වැදගත් ම කරුණ නම් පළමුවැන්න දෙවැන්නට වඩා අප වැනි රටවලට සමීප වීම ය. එහි ප්‍රතිඵලයක් ලෙස අප රටෙහි ද පෘතුගීසි සංස්කෘතියට වඩා ලන්දේසි සංස්කෘතිය ව්‍යාප්තකිරීම අසීරු විය. අනෙක් අතට ලන්දේසීහු ඉංගිරිසින් තරමට උපක්‍රමශීලී ද නො වූහ. ඒ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ ලන්දේසීන් බලාපොරොත්තු වූ තරමට ඔවුන්ගේ අධ්‍යාපන වැඩපිළිවෙළ මෙරට සාර්ථක නො වීම ය. ලන්දේසීන් තම සංස්කෘතිය පැතිරවීම පිණිස මෙරට පාසල් පිහිටුවුව ද මෙරට සංස්කෘතියට එතරම් බලපෑමක් කිරීමට ඔවුන්ට නොහැකි විය.

එහෙත් ඉන්පසුව පැමිණි ඉංගිරිසිහු එසේ නො වූහ. ඔවුන්ගේ අධ්‍යාපන ව්‍යාපෘතිය ඉතා සාර්ථක විය. ඒ කෙතරම් සාර්ථක වී ද යතහොත් අද මෙරට අධ්‍යාපන විශේෂඥයන් යනුවෙන් හැඳින්වෙන්නෝ ඉංගිරිසි අධ්‍යාපන ක්‍රමය වෙනුවෙන් පෙනී සිටිති. කිසිම නිර්මාණශීලී බවක් නැති මේ විශේෂඥයෝ විශ්වවිද්‍යාලවල ද අධ්‍යාපන ආයතනවල ද අනුකාරිකව ඉංගිරිසි අධ්‍යාපන ක්‍රමයට සේවය කරති.

ඉංගිරිසින් එවැනි සාර්ථකත්වයක් අත්පත් කරගත්තේ කෙසේ ද? ඉංගිරිසිහු බොහෝ කරුණුවලින් ලන්දේසීන්ට ද වඩා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඉදිරියට ගොස් සිටියහ. එබැවින් ම ඉංගිරිසි සංස්කෘතිය මෙරටට සාමාන්‍ය

© Prof. Nalin De Silva

ආකාරයකින් හඳුන්වාදීමට වුව ද උගහට විය. ඉංගිරිසින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඉදිරියට ගොස් සිටි බැවින් ම එක් අතෙකින් ගත්කල ඔවුන්ට යම්කිසි කාර්යයක් ඒ සංස්කෘතියෙහි ක්‍රමවත්ව සැලසුම් සහගත ව කිරීමේ හැකියාව විය. ඔවුන් කිසිවක් කෙළේ යම් හැදෑරීමකින් පසුව ය. මේ හැදෑරීම් හා කුමානුකූලව ආයතනගත ව වැඩකිරීමට ඔවුන්ට වූ හැකියාව හේතුකොටගෙන ඔවුහු ක්‍රමයෙන් මෙරට අධ්‍යාපනය තම අතට ගත්හ.

ඉංගිරිසින්ට අනෙක් රටවල ද තම සංස්කෘතිය පැතිරවීමෙහි අවශ්‍යතාව විය. එහෙත් අප රටෙහි ඔවුන්ට ඒ පිළිබඳව වූ අවශ්‍යතාව අනෙක් රටවලට වඩා වැඩි විය යනු මගේ අදහස වෙයි. එයට ප්‍රධාන හේතුව වූයේ සිංහල බෞද්ධ සමාජයෙහි භික්ෂූන් වහන්සේ දැරූ නායකත්වය ය. මෙරට අධ්‍යාපනය මෙහෙයවනු ලැබුයේ භික්ෂූන් වහන්සේ විසින් ය. එමෙන් ම සංස්කෘතිකව ද උන්වහන්සේ සාමාන්‍ය ජනතාව සමග බැඳී සිටියහ. ජනතාවගේ හිත සුව පිණිස එකල භික්ෂූන් වහන්සේ ගම පුරා ඇවිද්ද සේක. ජනතාවගේ ඕනෑම කටයුත්තක දී භික්ෂූන් වහන්සේ මැදිහත්වීමත් උන්වහන්සේ විසඳුන් වීමත් හේතුවෙන් ඉංගිරීසිහු තමන්ට ඇති අභියෝගය භික්ෂූන් වහන්සේ බව තේරුම් ගත්හ. ඉංගිරිසින්ට ලන්දේසීන්ට මෙන් නොව භික්ෂූන් වහන්සේ ජනතාවට කරන බලපෑම නැවැත්වීමට අවශ්‍ය විය.

ඉංගිරිසින් මේ කරුණ පිළිබඳ ව සංවේදී වූ බව ඉංගිරිසි ආණ්ඩුකාරයන් ලංඩනයේ සිටි යටත්විජිත ලේකම්වරයාට යවා ඇති ලිපිවලින් ද පැහැදිලි වෙයි. ඔවුන් ලංඩනයට දන්වා යවා ඇත්තේ භික්ෂූන් වහන්සේ සිටින තෙක් සිංහලයන් යටත්කිරීමට නොහැකි බව ය. භික්ෂූන් වහන්සේ හා ගිහි බෞද්ධයන් අතර ඇති සම්බන්ධය හේතුකොටගෙන උන්වහන්සේ ගිහියන්ගේ උත්පත්ති, මරණ ආදී වශයෙන් ඇති සෑම කටයුත්තකදීම සහභාගිවන බවත් රෝගී බෞද්ධයන් බැලීමට යන බවත් එවැනි අවස්ථාවල දී ද බ්‍රිතානීන්ට එරෙහිව ජනතාව මෙහෙයවන බව ආණ්ඩුකාරවරුන් දන්වා ඇත. එබැවින් භික්ෂූන් වහන්සේ සමාජය කෙරෙහි කළ බලපෑම නැතිකිරීම ඉංගිරිසින්ගේ ප්‍රධාන අභිලාෂයක් විය.

ඉංගිරිසින් මෙරට පාසල් ඇතිකෙළේ භික්ෂූන් වහන්සේ අධ්‍යාපනයෙන් ඈත්කර තැබීමේ වුවමනාව ද සපුරාලමිනි. කෝල්බෲක් කැමරන් යෝජනාවලින් ද පාසල් ඇතිකිරීම සඳහා ලැබුනේ අනුබලයකි. ඉංගිරිසිහු අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් පිහිටුවා එහි ප්‍රධානියා ලෙස මෙරට ඇංග්ලිකන් පල්ලියේ ප්‍රධාන පූජකවරයා ලෙස පත්කළහ. පාසල්වල උගන්වන විෂය නිර්දේශය සකස් කරන ලද්දේ ඒ ප්‍රධාන පූජකවරයාට අවශ්‍ය අන්දමිනි. විශේෂයෙන් ම මෙරට පිහිටුවනු ලැබූ ඉංගිරිසි පාසල් ලෙස හඳුන්වනු ලැබූ ඉංගිරිසි මාධ්‍යයෙන් උගන්වනු ලැබූ පාසල්වල දෙනු ලැබූ අධ්‍යාපනය එංගලන්තයට අවශ්‍ය එකක් මිස මෙරටට අවශ්‍යවූවක් නො වී ය.

එසේ වුවත් සිංහල මාධ්‍යයෙන් උහන්වනු ලැබූ පාසල්වල ඉගැන්වූ ගුරුවරුන් පැරණි අධ්‍යාපනයෙන් මුළුමනින් ම බැහැරකිරීමට ඉංගිරිසින්ට නොහැකි විය. ඒ සියළු පාසල් සඳහා ඉංගිරිසින්ට තමන්ට අවශ්‍ය ආකාරයේ ගුරුවරුන් පිරිසක් බිහිකර ගැනීම ද අසීරු විය. එහි ප්‍රතිඵලය වූයේ සිංහල මාධ්‍යයෙන් උගන්වනු ලැබූ පාසල්වල විෂය නිර්දේශය ඉංගිරිසින්ගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සකස් කෙරුණ ද, එහි ඉගැන්වීම කෙරෙහි භික්ෂූන් වහන්සේගේ බලපෑම දිගින් දිගටම පැවතීම ය. ඉංගිරීසි පාසලින් බිහිකරනු ලැබූ උගතා හා සිංහල පාසලින් බිහිකරනු ලැබූ උගතා අතර පැහැදිලි වෙනසක් ආකල්ප අතින් ද විය.

ඉංගිරිසින් ඇතිකළ ඉංගිරිසි පාසල්වලින් ක්‍රමයෙන් රටට එළක් නැති, බොහෝවිට රටට ද්‍රෝහි විය හැකි පිරිසක් බිහිවන බව සිංහල බෞද්ධයනට නොවැටහුණා නො වේ. එහෙත් ඒ සම්බන්ධයෙන් කළ යුත්තේ කුමක් දැයි ඔවුහු නොදැන සිටියහ. ඕල්කට්තුමා ගේ මැදිහත්වීමෙන් බෞද්ධ පාසල් ඇතිකිරීමෙන් වුව ද මේ තත්වයේ වෙනසක් නො වී ය. බෞද්ධ ඉංගිරිසි පාසල් බෞද්ධ සිංහල පාසල්වලින් වෙනස් විය. බෞද්ධ ඉංගිරීසි පාසල්වල ද උගන්වනු ලැබුයේ අනෙක් ඉංගිරිසි පාසල්වල උගන්වනු ලැබූ පාඨමාලා ම ය. වෙනසකට තිබුණේ ඒ පාසල්වල බුද්ධාගම ඉගැන්වීම, පන්සිල් ගැනීම වැනි දෑ ය. එහෙත් එපමණකින් ඒ පාසල්වලින් ද ලැබුණු ක්‍රිස්තියානි අධ්‍යාපනය වෙනස් කිරීමට නොහැකි විය.

ඒ හැරත් ඕල්කට්තුමා බෞද්ධයකු වූ පරම විඥානාර්ථවාදියෙක් විය. එතුමන් ඇතුළු පිරිසක් මෙරටට පැමිණියේ පරම විඥානාර්ථවාදීන් ලෙස ය. පරම විඥානාර්ථවාදීහු පරම විඥානයක් ගැන විශ්වාස කරති. පරම විඥානය යනු

© Prof. Nalin De Silva

අන් කිසිවක් නොව බ්‍රහ්මන් ය. බ්‍රහ්මන් යනු නිර්මාපකයකු වුවත් නැතත් අවසාන විග්‍රහයේ දී පරම ආත්මයක් බවට පත්වන සංකල්පයකි. පරම විඥානාර්ථවාදය සමග බුදුදහමට පෑහීමක් නැත. අනෙක් අතට පරම විඥානාර්ථවාදියකුට බෞද්ධයකු වීමට ද නො හැකි ය. එබැවින් බෞද්ධ පරම විඥානාර්ථවාදියා යන්න මෙන් ම පරම විඥානාර්ථ බෞද්ධ යන්න ද පරස්පර විරෝධතා සහිත සංකල්ප වෙයි.

කෙසේ වෙතත් ඕල්කට්තුමා කිසි දිනෙක සිංහල බෞද්ධයෙක් නො වී ය. එතුමා පරස්පර සහිතව වුවත් බෞද්ධ පරම විඥානාර්ථවාදියකු වන්නට ඇත. එහෙත් එතුමා කිසි දිනෙක පසු කලෙක තිබ්බතයෙන් මෙහි පැමිණ පැවිදි වූ මහින්ද හිමියන් මෙන් සිංහල බෞද්ධයෙක් නො වී ය. සිංහලයකු වීමට සිංහල දෙමව්පියන් සිටීම අනිවාර්ය හෝ ප්‍රමාණවත් හෝ නො වේ. යමකු සිංහල වන්නේ සංස්කෘතියෙනි. ඕල්කට්තුමාට සිංහල සංස්කෘතියට අවශෝෂණය වීමට නොහැකි විය.

එමෙන් ම ඕල්කට්තුමා ඉංගිරිසි අධ්‍යාපනය ප්‍රතික්ෂෙප නො කෙළේ ය. එතුමා එක් පැත්තකින් පරම විඥානාර්ථවාදියෙක් විය. අනෙක් පැත්තෙන් බෞද්ධයෙක් විය. එපමණක් නොව එතුමා ඉංගිරිසි හේතුවාදය හෙවත් බුද්ධිවාදය (rationalism) ද පිළිගත්තේ ය. එතුමා මෙරටට පැමිණියේ ද බුදු දහම හේතුවාදී යැයි වරදවා වටහාගත් බැවිනි. පාණදුරාවාදය ගැන කියවූ ඕල්කට්තුමාට මැවුම්කරුවකු නැති දහමක් කෙරෙහි සිත ගිය බවට සැකයක් නැත. මෙකල බටහිර හේතුවාදී උගත්තු ඩාවිනීය පරිණාමවාදයට ආකර්ෂණය වූහ. ඕල්කට්තුමා පැමිණ ඇතිකළ ඊනියා බෞද්ධ අධ්‍යාපනයෙහි ද මේ පරස්පර සියල්ල විය. ඒ අධ්‍යාපනයට ඉංගිරිසි ආණ්ඩුව ලබාදුන් අධ්‍යාපනය අභියෝගයට ලක්කිරීමට නොහැකි විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva